# “නිම් තෙරක්”



මෙවර “ගී සඳැළුව”ට ගොඩවැදීමට ඇරයුම් ලබන්නේ “නිම් තෙරක් ” ගීතයයි. ගීය වෙනුවෙන් එහි එක් නිර්මාණකරුවකු හා ගායන ශිල්පියාණන් සම්බන්ධ කරගැනීමට අපි සමත් වූයෙමු. ගීයේ බඳ නිබන්ධකයාණන් වන බන්දුල නානායක්කාරවසම් ප්‍රවීණයාණන් ද ප්‍රවීන ගායන ශිල්පී සුනිල් එදිරිසිංහයන් ද අප හා මුහුවූයේ කලකට පසුව කළ සුහද පිළිසඳරකින් පසුවයි.

ගීයේ පසුබිම පිළිබඳව සිහිපත් කිරීමේදී බන්දුල් නානායක්කාරවසම් පද රචකයාණන්ගේ මතකය වඩාත් සිත්ගන්නා සුළු විය. මුලින්ම අපි ඔහුට සවන් දෙමු.

“ගුවන් විදුලියේ සරළ ගී වැඩසටහනකටයි මේ සින්දුව ලිව්වේ. ඒ 1988 - 89 විතර. සුනිල්ගේ මේ වැඩ සටහනට මම, සපු එහෙම සින්දු ලිව්වා. මම ලියපු ගීතය තමයි “තබන්න මා කිනිහිරියේ....” කියන ගීතය. ඒත් කුලේ අයියට ලියන්න පවරල තිබුණ ගීතය කලින් දවස වෙනකල්ම ලියැවිලා නෑ”. බන්දුල “කුලේ අයියා” නමින් හඳුන්වන්නේ කුලරත්න ආරියවංශ ප්‍රවීන ගී පද නිබන්ධකයායි. කුමාරදාස සපුතන්ත්‍රි ප්‍රවීණ ගී පද නිබන්ධකයා ය “සපු” නමින් ඔහු හඳුන්වන්නේ.

“ඉතින් පටිගත කරන දවසට කලින් දා රෑ අටට විතරයි කුලේ අයියා මේ වැඩේ මට පැවරුවේ. ඇත්තටම රෝහණගේ තනුවකට පද හොයන්නයි කුලේ අයිය මට පවරලා තිබුණේ. ඉතින්ඔය තාලය මතක තියාගෙන කුලේ අයියා මට ඩමියක් විදියට හදාගත්ත බොරු වචන ටික කිව්වේ මේ විදියට :

“තරු කඩා වැටෙන මේ රාත්‍රියේ
පිඩු සිඟා වඩින සඳ මාවතේ
මගේ දකුණු අත
මගේ දකුණු අත
ල ලා ලලා - ලල ලා
ලා ලල ලා.......”

තනුවට පද යෙදීමේදී මුලින් ම අරුත ගැන නොසිතා එවේලේ සිතට එන වදන් වලින් තාලයට ගැලපෙන සේ බොරු පද වැලක් නැතහොත් “ ඩමියක් ” ලියා ගැනීම සිරිතයි. මෙහිදී ලඝු අකුරු යෙදෙන පිළිවෙලත්, මාත්‍රා ගණනත්, අකෘතියත් පමණ් වැදගත් වෙයි. කුලරත්න ආරියවංශයන් තමන්ට රෝ හණ වීරසිංහ සංගීත වේදීයාණන් දුන් තාලය බන්දුලට දුන් අයුරුයි, ඒ. නැවතත් බන්දුලට සවන් දෙමු.

”ඉතින් මම පාන්දර දෙක විතර වෙනකලුත් දඟලලා ලියාගන්න පුළුවන් වුනේ කොටස් දෙකයි.” මෙම ගීයේ ස්ථායී කොටසත්, අන්තරා කොටස් දෙකත් ගැයෙන්නේ එක ම තනුවකටයි. “ඩමියට” අනුව බන්දුල ලියූ මුල් කොටසයි මේ.

“නිම් තෙරක් නොදුටු මේ ලෝකයේ
රැප් සපුන් නිබඳ සරනා බිමේ
ඔබේ සිනාවත
මගේ නවාතැන
අරුණ විහිදුවා ලී - ජීවිතයේ ”

“උදේම සුනිල් අයියා මාවත් අරගෙන ගුවන් විදුලියට යනකොටත් මගේ හිතේ ලොකු බරක් තිබුණා. මොකද, තුන් වෙනි කොටස ලියාගන්න බැරි වුණ නිසා. කොහොම වුණත් මේ සින්දුවට ගිටාර් එක ගහන්න නියමිත වෙලාවක් තිබුණා. මහින්ද බණ්ඩාර එන්න පමා වුණ නිසා අනික් සින්දු දෙකක් ම කලින් කරන්න ගත්ත එක මගේ වාසියට හිටියා. මම ඒ අතරේ පියානෝ එකක් උඩ තියාගෙන අන්තිම කොටස ලියලා දුන්නා. සාමාන්‍යයෙන් මේ පටිගත කිරීම්වලට අපි හැමෝම බලන්න යනවා. කුලේ අයියා එයාගේ වැඩේ මට පවරපු නිසා ඒ වෙනකොටත් එයා ඇවිත් හිටියේ නෑ. එයාගේ පමාවත් වාසියට අරගෙන මම මේ ගී පද රචනාව සම්පූර්ණ කළා. යටින් කුලේ අයියගේ අත්සන ගහලයි දුන්නේ. මොකද ඒ සරළ ගී වැඩ සටහනට අපි හැමෝගෙම පද රචනා තිබුණා; එයාගේ විතරයි නොතිබුණේ....”

අපූරු කතාවකි ඒ. අනුන්ගේ නිර්මාණ කොල්ලකන මෙවන් කාලයක නිර්මාණ බෙදා හදා ගැනීමක් පිළිබඳව අසන්නට ලැබීම පවා මහත් සතුටකි. එහෙත් ඒ දශක දෙක හමාරකට පෙරදීයි. එහෙත් අද ?

“ඒත් කුලේ අයියා ආව ගමන් ඒක දැකලා “මෝඩ වැඩ කරන්න එපා.” කියලා මට දොස් කියලා එයාගෙ නම කපලා මගේ නම ලිව්වා.” කුලරත්න ආරියවංශයන්ගේ නිහතමානී බව, අවංක බව මෙන්ම හෘදයාංගම බව ක්ෂේත්‍රයේ සැවොම දන්නා ගුණාංගයන්ය.

“ඔය කාලයේ තමයි මම විවාහ වුණේත්.” බන්දුල තමන්ගේ පදරචනාවේ නිමිත්ත ගැන කීමට සූදානම් වීය.

“අපේ ආදරය තිබුණා ඒ දවස් වල. ඕකට ඉතින් ගෙවල් වලින්.... දන්නැද්ද ඉතින්. ලොකු තැනකින් මට කටයුත්තකුත් කතා කරලයි තිබුණේ. ඒකට පයින් ගහල තමයි මේ මගේ ආදරවන්තිය විවාහ කරගත්තේ. ආදරයේ තියෙන නිම් හිම් නැතිකම තමයි මම මේ පද පෙළින් ලියන්න උත්සහ කළේ.....” බන්දුල නානායක්කාරවසම් නිබන්ධකයාණන් ගේ සිනහව දුරකථනය තුළ රැව් දෙන අතරේම අපි ඔහුට ස්තූතිවන්ත වී සමුදුන්නෙමු. ඒ ගීයේ ගායන ශිල්පියාවන සුනිල් එදිරිසිංහයන් ව ද ඇමතීමේ





අදහසිනි.

සුනිල් එදිරිසිංහයන් හා අප අතර පිළිසඳරට මාතෘකාව කරගන්නා ලද්දේ මේ ගීයේ නමින් මෙල්බන් නුවර ඉදිරිපත් කිරීමට සැරසෙන ප්‍රසංගයයි.

“මුල් කාලවලදී මම බොහොම වෙලාවට මේ වගේ සංචාරවල යෙදුනේ රෝහණ වීරසිංහ සමඟ. මේ “නිම් තෙරක් ” ප්‍රසංගය සංවිධානය කරන අයගේ අවශ්‍යතාවේ හැටියට මේ වාරේ මම එන්නේ තරුපති මුණසිංහ සමගයි.” එදිරිසිංහයන් මුල පිරී ය.

“විදේශ ගත වී සිටින අපේ ශ්‍රී ලාංකිකයින්ගෙන් ඇත්තටම වෙනසක් දැනෙනවා. ඒඅ යට මව් රටේ තියෙන අවස්ථා නෑ. කලාතුරකින්නේ අපි හමුවෙන්නේ. ඒක ඉතින් ඒ අයගේ ප්‍රතිචාරවලින් අපට දැනෙනවා..”

“අනික් විශේෂත්වය තමයි ඒ අයගේ දරු දැරියන් බොහොම කාලයක් අපේ දේවල්වලින් ඈත් වෙලා ඉන්න එක. ඒඅ යට අපේ දේවල් ළං කරවන එක වැදගත්. ඒ අයට මේ වාගේ ප්‍රසංගයකදී අත් විඳින්න ලැබෙන්නේ ගීතය පමණක්ම නෙවෙයිනේ.

තවත් වටිනා දේවල් අහන්නට දකින්නට ලැබෙනවා. ගීතය කියන්නේ මානුෂීය ගුණධර්ම, සාරධර්ම කැටිවුණ නිර්මාණයක්. මම මේ කියන්නේ සුභාවික ගීතය ගැන. ඒ තුළින් සමාජය පෝෂණය කරන්න පුළුවන්. හොඳ ගීයවලින් සමාජයේ හොඳ ප්‍රගමණයක් ඇති කරවන්න පුළුවන්.”

“අද ලෝකය යන දිශාව වෙනස්; බෝම්බ, න්‍යෂ්‍ටික ආයුධ, වස විස එක්කයි ලෝකය යන්නේ. අපි තුළ තියෙන සංවේදී බව නැතිවීම නිසයි. සංවේදී බව, මනුස්සකම නංවන්න පුළුවන් ප්‍රධාන ම දේ තමයි ආගම. වෙනුව කලාව. ගීතය කියන්නේ විනාඩි කීපයක් ඇතුලත මානසික ලෝකය වෙනස් කරන ප්‍රබල කලාංගයක්. ඒක හොඳ අතටත් නරක අතටත් යොදාගන්න පුළුවන්. අර්ථ පූර්ණ, රස පූර්ණ ගීයකින් බොහෝ දේ කරන්න පුළුවන්.”

“ඒත් ඒක නිර්මාණ කරුවාට පමණක් තනිව කළ හැකි දෙයක් නෙවෙයි. හොඳ රසික පර්ෂධයක් සිටිය යුතුයි. කලා කරුවා දෙන දේ ඉදිරියට ගෙනයන්නේ රසිකයන්. අර්ථ විමසමින්, ස්වර රස විඳිමින්, භාව පූර්ණ වූ ගායනාවන් සංවේදීව විඳීම වැදගත්. එහෙම රසිකයන් හොඳ ගීයකට ප්‍රාබල්‍ය ලෙස බලපාන සාධකයක් වෙනවා.”

ඉතින් මෙවැනි දේ විඳීමට හොඳ රසිකයින්ට අවස්ථාව ලබා දෙමින් මේ ප්‍රසංගය සංවිධානය කරන දිළුම් ද සිල්වා ඇතුළු පිරිසට ස්තූතිවන්ත වෙන්න ඕන. ඇත්තටම ඒ අය ආර්ථික පැත්තෙනුත් අවධානමක් අරගෙන මේ කරන්නේ දුෂ්කර කාර්යයක්.”

“සුභාවික ගීතය ප්‍රියකරන රසික රසිකාවන්ට සෙනෙහසින් ලබැඳියාවෙන් යුතුව මම ආරාධනා කරනවා මේ ප්‍රසංගය බලන්න එන්න කියලා....” සුනිල් එදිරිසිංහන් ලෙන්ගතු හඬින් සිය ආරාධනය කළේය. අපි තුති පූර්වකව ඔහුට සමුදුන්නෙමු.

සිසිර දිසානායක

*නිම් තෙරක් නොදුටු මේ ලෝකයේ*
*රුදු සපුන් නිබඳ සරනා බිමේ //*
*ඔබේ සිනා වත*
*මගේ නවා තැන*
*අරුණ විහිදුවා ලී - ජීවිතයේ*

*රැල් නගා ගලන ගංගා දියේ*
*මං වසා දමනු හැකි දෝ කෙසේ //*
*සොයා සයුරු දිය*
*හඹා ඇවිත් ගඟ*
*සදා සැඟව යාවී - සාගරයේ*

*සිල් බිඳී මුවන් කැළඹූ වනේ*
*බිම නොලා නෙලූ පල මාවතේ //*
*සදා ඔබේ ගිම්*
*නිවා ගනිම් මම*
*තැවුල් සැඟව යාවී - මාරුතයේ*

*නිම් තෙරක්........*

*ගායනය :සුනිල් එදිරිසිංහ*
*රචනය : බන්දුල නානායක්කාරවසම්*
*සංගීතය: රෝහණ වීරසිංහ*

සන්නස Cartoon by PK

